# කෝරලේපත්තු බටහිර ප්‍රාදේශීය සභාව - 2016
## මඩකලපුව දිස්ත්‍රික්කය

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2017 මැයි 05 දින ද පසුගිය වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 ජුනි 08 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ඔක්තෝබර් 12 දින සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට කෝරලේපත්තු බටහිර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත දැක්වෙන එක් එක් ගිණුම් විෂයයන් ඉදිරියේ පෙන්වා දී ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයය | වටිනාකම ( රු. ) | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | 35 ,936,292 | ඉඩම් හිමිකම් ඔප්පු |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 1,013,826 | ස්ථාවර වත්කම් ලේඛන |
| ලී බඩු හා උපකරණ | 1,971,105 | ස්ථාවර වත්කම් ලේඛන |

#### 1.3.2 නීති, රීති හා කළමණාකරන තීරණ ආදියට අනුකූල නොවීම

වර්ෂ 03 ක් ඉක්ම වූ රු.8,148,122 ක කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 571 මුදල් රෙගුලාසිය ප්‍රකාරව ආපසු ලබා දී නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.899,694 ක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.3,075,190 ක් විය.

### 2.2 ආදායම් කළමනාකරණය

----------------------------

#### 2.2.1 උසාවි දඩ

-----------

2016 දෙසැම්බර් 31 දිනට හිඟ හිට පැවැති රු.4,633,368 ක උසාවි දඩ ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කරනු ලැබූ 2016 දෙසැම්බර් 31 දිනට පෙර සම්පූර්ණ කළ යුතුව පැවැති මාර්ග කොන්ක්‍රීට් කිරීම සහ කානු ඉදිකිරීම් කර්මාන්ත 2017 ජූනි 24 දින වන විටත් ආරම්භ කර නොතිබූ නමුත් එම කර්මාන්ත සෑහීමට පත්විය හැකි අයුරින් නිම කළ බවට තාක්ෂණික නිලධාරීගේ නිර්දේශය මත එම අමාත්‍යාංශයෙන් 2016 දෙසැම්බර් 31 දින රු.4,136,144 ක මුදලක් ලබාගෙන තිබුණි.

(ආ) පොදු අරමුදල් ඵලදායීව භාවිතා කිරීමේ අරමුණෙන් පළාත් සභා සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් වෙන්කරනු ලබන අරමුදල් යටතේ ක්‍රියාත්මක කරනු ලබන කර්මාන්ත සඳහා දිගු කාලයක් ගතවන කාපට් දැමීම, කොන්ක්‍රීට් දැමීම හා තාර දැමීම් හැර බොරළු දැමීම් ආදි තාවකාලික මාර්ග ඉදිකිරීමේ කටයුතු සිදුකළ නොයුතු බවට 2015 දෙසැම්බර් 30 දිනැති අංක 2016/01 දරන මුදල් කොමිෂන් සභා චක්‍රලේඛයේ සඳහන් කර තිබුණත්, ඒ පිළිබඳව සැලකිල්ල යොමු නොකොට සමාලෝචිත වර්ෂයේ සභාව විසින් මාර්ග 19 කට රු.661,725 ක වියදමින් බොරළු දමා තිබුණි.

### 3.2 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව අනියම් සහ කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් බඳවා ගැනීමේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගෙන නියමිත අයවැය ප්‍රතිපාදන වෙන්කිරීම් අනුමත කරගැනීමෙන් අනතුරුව සේවකයින් බඳවාගත යුතුවේ. එසේ වුවත්, පූර්ව අනුමැතිය සහ නිර්දේශය

ලබානොගෙන 2015 සහ 2016 වර්ෂවලදී සේවකයින් 21 දෙනෙකු අනියම් සහ කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි.

(ආ) 2011 පෙබරවාරි 24 දිනැති අංක 02/2011 දරන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව, අනියම් සහ තාවකාලික පදනමින් බඳවා ගනු ලබන සේවකයින් සඳහා සේවකයින්ගේ සියයට 8 ක දායක මුදලක් සහ සේව්‍යයාගෙන් සියයට 12 ක දායක මුදලක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට යැවිය යුතුය. එසේ වුවත්, 2015 සහ 2016 වර්ෂවලදී අනුයුක්ත කරනු ලැබූ සේවකයින් 21 දෙනෙකු සඳහා එලෙස දායක මුදල් යවා නොතිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

## 4.1 නිරවුල් නොකළ විගණන ඡේද

සභාව සම්බන්ධයෙන් විගණකාධිපති වාර්තාවල ඇතුළත් කරනු ලැබූ විගණන ඡේදවලින් අනාවරණය කරනු ලැබූ ඌනතාවයන් සහ අඩුපාඩු සම්බන්ධයෙන් සභාව මේ දක්වා නිවැරදි කර නොතිබූ විගණන ඡේදවලට යොමුව පහත දැක්වේ.

| වාර්තාවට යොමුව | | අන්තර්ගත කරුණු |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2015 | 2.2.4 (අ) I | ඇප මුදල් ලබාගත යුතු නිලධාරීන්ගෙන් ඇප මුදල් ලබාගෙන නොතිබුණි. |
| 2015 | 4.1 (ඉ) | වාලච්චේන කඩදාසි කර්මාන්ත ශාලාවෙන් අයකර ගත යුතු වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| 2015 | 4.1 (ඊ) | විශ්‍රාම ගිය, ස්ථාන මාරු වී ගිය සහ සේවය අත්හිටවූ නිලධාරීන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු.59,416 ක හිඟ ණය මුදල අයකර ගැනීමට ක්‍රියාමාර්ග නොගැනීම. |
| 2015 | 4.2 (ආ) | භාවිතා නොකරන ට්‍රැක්ටර භාවිතා කිරීමට කටයුතු කර නොතිබීම. |

## 4.2 පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පාලන ක්ෂේත්‍රය | විශේෂ අවධානය යොමු කළ යුතු විෂයයන් |
|---|---|
| (අ) ආදායම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. |
| (ආ) ස්ථාවර වත්කම් පාලනය | (i) ස්ථාවර වත්කම් ලේඛන පවත්වා ගැනීම<br>(ii) භාවිතා නොකර නිෂ්කාර්යව පවතින වත්කම් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගැනීම. |